**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**--------------------------------------------------**

**1. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>**

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>**

**1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------- | ---------------------------- |
| (අ) | වැය විෂයයන් දෙකක වියදම රු.261,586 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරන බව දන්වමි. |
| (ආ) | රු.2,217,989 ක් ණයහිමි ශේෂය ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ඇ) | කර්මාන්ත ණයගැති ශේෂය රු.176,158 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | නොපිය වූ අත්තිකාරම් ශේෂය රු.747,821 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.2 <u>නොසැසඳුනු ගිණුම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------------- |
| මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයයන් 05 ක ශේෂ හා උපයෝගී ලේඛන අතර රු.6,856,272 ක නොසැසඳීමක් විය. | වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කළ යුතුවේ. | වෙනස්කම් පරීක්ෂා කර ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | <u>ලැබිය යුතු ගිණුම්</u><br>අවුරුදු 05 ට වැඩි කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.511,415 ක් විය. | ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අය කර ගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |
| (ආ) | <u>ගෙවිය යුතු ගිණුම්</u><br>අවුරුදු 05 ට වැඩි කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.1,529,011 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**1.3.4 <u>අනුකූල නොවීම</u>**

**1.3.4.1 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | | |
| | 5(8) වගන්තිය | ස්ථාවර වත්කම්වල ආරක්ෂාව සහතික කිරීමට කටයුතු යොදා නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිලධාරී හිඟය පවතින අතර, ඉදිරියේ දී නිවැරදි කිරීම සඳහා කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | වෙනත් චක්‍රලේඛ | | | |
| (i) | 2016 මාර්තු 17 දිනැති මප/ප.පා.කො. චක්‍රලේඛ අංක 2016/03 | | | |
| | • 4.1 වගන්තිය | කඩ කාමර බදු දීම සඳහා ගිවිසුම්ගත වීමේ දී, මාසික කුලිය ගෙවිය යුතු දිනය හා ප්‍රමාද ගාස්තු පිළිබඳ තොරතුරු ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි. | ගිවිසුම නිවැරදිව පිළියෙල කළ යුතුවේ. | නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කරන බව දන්වමි. |
| | • 5.1 වගන්තිය | 2008 වර්ෂයෙන් පසු කඩ කාමර කුලි මුදල් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | නව තක්සේරු සිදු කළ යුතුවේ. | නව තක්සේරු ලැබී ඇති අතර, එය පදනම් කර ගෙන ඉදිරියේ දී ගිවිසුම් අත්සන් කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| • 06 වගන්තිය | සිල්වර් ලැන්ඩ් ඉඩමේ කඩ කාමර 15 සඳහා නව බදු කුලිය පදනම්ව ගිවිසුම් අලුත් කර නොතිබුණි. | ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කළ යුතුවේ. | නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 හා 7.11.1 යන වගන්ති | ප්‍රසම්පාදන සහ තාක්ෂණික කමිටු නිර්දේශ ලිඛිතව සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,875,212 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,773,803 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,000,000 | 5,840,349 | 5,000,738 | 5,091,404 | 1,050,000 | 683,936 | 549,384 | 855,634 |
| (ii) | කුලී | 4,203,500 | 1,449,217 | 1,595,057 | 213,778 | 2,303,220 | 2,150,220 | 1,780,449 | 576,737 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 715,200 | 735,710 | 717,860 | 343,700 | 480,000 | 782,376 | 695,676 | 519,000 |
| (iv) | වෙනත් ආදායම් | 23,375,000 | 18,098,784 | 37,995,424 | 11,391,045 | 25,295,000 | 21,630,955 | 12,096,304 | 32,920,813 |
| | එකතුව | 33,293,700 | 26,124,060 | 45,309,079 | 17,039,927 | 29,128,220 | 25,247,487 | 15,121,813 | 34,872,184 |

#### 2.2.2 <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වරිපනම් | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට අය විය යුතුව තිබූ රු.414,734 ක වරිපනම් බදු අය කර නොතිබුණි. | හිඟ මුදල් අය කිරීමට කටයුතු කළ යුතුවේ. | ආදායම් පරීක්ෂකවරුන්ගේ හිඟයක් පවතින අතර, ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) ජල බදු
----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල් කළ ජල බදු ගාස්තුවලින් රු.2,977,635 ක් අය කර නොතිබුණි. | ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට ගැනීමට කටයුතු කරමි. |

**2.2.3** <u>බලපත්‍ර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ත්‍රීරෝද රථ ගාස්තු | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.561,100 ක ත්‍රීරෝද රථ ගාස්තු අය කර ගත යුතුව පැවතුණි. | ත්‍රීරෝද රථ ආදායම් අය කළ යුතුවේ. | ඉදිරියේ දී අය කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගනිමි. |

**2.2.4** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.2,301,215 ක් හා මුද්දර ගාස්තු රු.9,089,830 ක් විය. | ලැබිය යුතු මුදල් ලබා ගත යුතුවේ. | ප්‍රතිපූර්ණය කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරමි. |

**3.** <u>මෙහෙයුම් සමාලෝචනය</u>

**3.1** <u>කාර්යසාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ කාර්යයන්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වටිනාකම රු.46,763,670 ක් වූ ජල යෝජනා ක්‍රම 04 ක් සඳහා ජල පෙරණ සකස් කර නොතිබුණි. | යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුවේ. | අවශ්‍ය ඉදිරි කටයුතු සැලසුම් කර ඇති බව දන්වමි. |
| (ii) | වටිනාකම රු.12,742,700 ක් වූ ගොඩනැගිලි 07 ක් අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ප්‍රයෝජනයට ගත හැකි පරිදි සකස් කළයුතුවේ. | ඉදිරි කටයුතු සැලසුම් කර ඇති බව දන්වමි. |

(ආ) <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉවතලන අප ද්‍රව්‍ය, අමු ද්‍රව්‍ය ලෙස භාවිතා කර කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | කොම්පෝස්ට් නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. | වාර්තා සකස් කර පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇති බව දන්වමි. |

## 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනුමැතියකින් තොරව වැය විෂයයන් 05 ක සියයට 19 සිට සියයට 57 ක් දක්වා ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි. | ප්‍රතිපාදන සීමාව තුළ වියදම් දැරිය යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත තනතුරුවල පුරප්පාඩු 13 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. | අනුමැතිය ඉල්ලා ඇතත්, රජයේ ප්‍රතිපත්ති මත ප්‍රමාද වී ඇති බව දන්වමි. |
| (ආ) | සේවක ණය | | |
| | නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.239,997 ක ණය ශේෂ අය කර නොතිබුණි. | ණය ශේෂ අය කිරීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කරමි. |

## 3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සිල්වර් ලැන්ඩ් පොදු ඉඩමේ කඩ කාමර 15 න් නව තක්සේරු කුලිය වෙනුවට පැරණි බදු කුලිය අය කිරීම හේතුවෙන්, රු.118,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | නව තක්සේරු අනුව ආදායම් අය කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2009 වර්ෂයෙන් පසු වරිපනම් තක්සේරුවක් සිදු කර නොතිබුණි. | කාලානුරූපීව තක්සේරු සිදු කළ යුතුය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම් ලේඛන ගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රජාශාලා 05 ක වටිනාකම් හඳුනා ගෙන ලේඛනගත කර නොතිබුණි. | වත්කම් හඳුනා ගෙන ලේඛනගත කළ යුතුවේ. | ඉදිරියේ දී හඳුනා ගෙන ලේඛනගත කරමි. |

**3.5.2 නඩත්තු හා අලුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.386,000 ක් වූ ළිං හා පිහිළි 27 ක් හඳුනා ගෙන වැඩි දියුණු කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවට අයත් වත්කම් හඳුනා ගෙන නඩත්තු කළ යුතුවේ. | ඉදිරියේ දී අලුත්වැඩියා කිරීම සඳහා කටයුතු කරමි. |

**3.5.3 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අක්‍රියව පවතින රු.7,000,000 ක් වටිනා ජල යෝජනා ක්‍රම 04 ක් වැඩි දියුණු කිරීමට කටයුතු කර නොතිබුණි. | ජල ව්‍යාපෘති වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරමි. |

**3.5.4 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.32,000,273 ක් වූ සුසාන භූමි 19 ක් හා ප්‍රජාශාලා 26 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී පවරා ගැනීමට කටයුතු කරමි. |

**3.5.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 වර්ෂයේ මිල දී ගත් රු.514,080 ක් වටිනා ජල මනු 144 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | ජල මනු සවි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ජල මනු සවි කිරීමට කටයුතු කරමි. |

**3.6 ආර්ථික නොවූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඇල්ලවත්ත හා මීපිටිය ජල යෝජනා ක්‍රම සඳහා මිල දී ගත් රු.1,734,600 ක් වටිනා ජල මනු 354 ක් භාවිතා නොකර, වර්ෂ 05 ක් පුරා නිෂ්ක්‍රීයව පැවති අතර, මනු මිල දී ගැනීම සඳහා ලබා ගත් ණය මුදලේ වාරික මුදල් සභා අරමුදලින් ගෙවමින් පැවතුණි. | ජල මනු සවි කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ජල මනු සවි කිරීමට කටයුතු කරමි. |

**3.7 ප්‍රසම්පාදනය**

**3.7.1 ඡායා පිටපත් යන්ත්‍රයක් මිල දී ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක් ආයතනයකින් පමණක් ඉදිරිපත් කළ මිල ගණන් පදනම් කර ගෙන රු.154,000 ක් ගෙවා ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | සභා තීරණයක් මත ක්‍රියාමාර්ග ගත් බව දන්වමි. |

**3.7.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ දී, ඉදිකිරීම් සිදු නොකරන ලද කාර්යයන් වෙනුවෙන් රු.602,042 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | ඉටු කළ වැඩ භෞතිකව පරීක්ෂා කර ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුවේ. | අත රැඳි මුදලින් අය කිරීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොලත් විගණන විමසුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 – 3.1(අ)(i) | | |
| | සභා බල ප්‍රදේශයේ කුඩා විදුලි බලාගාර පැවතියත්, අතුරු ව්‍යවස්ථා සකස් කර ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කරන බව දන්වමි. |

(ආ) 2018 – 3.3.(ඇ)

-------------------

| | | |
|---|---|---|
| ගලබඩ දිය ඇල්ල සංචාරක ස්ථානය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ ආරක්ෂාව, පරිසරයේ ආරක්ෂාව, සඳහා ක්‍රියාමාර්ගයක් නොගෙන ප්‍රවේශපත් පමණක් අලෙවි කිරීම සිදු කරන බව දක්නට ලැබුණි. | සභාව සතු සම්පත් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සියයට 40 ක වැඩ අවසන් අතර, ඉදිරියේ දී අඩුපාඩු සකස් කිරීමට කටයුතු කරමි. |

(ඇ) 2018 – 3.4.1(ආ)

---------------------

| | | |
|---|---|---|
| 2012 වර්ෂයේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.200,000 ක් වටිනා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය වර්ෂ ගණනාවක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | වත්කම් නිෂ්කාර්යය වීමට ඉඩ නොහැර භාවිතා කළ යුතුවේ. | අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර, ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |

(ඇ) 2018 – 3.5

--------------

| | | |
|---|---|---|
| ග්‍රීන් වුඩ් කළුගල් ව්‍යාපෘතියට අදාළ ඉඩම් භාවිතය වෙනුවෙන් පසුගිය වර්ෂ සඳහා රු.1,650,000 ක මුදලක් ඉඩම් ප්‍රතිසංස්කරණ සභාවට ගෙවා තිබූ නමුත්, ව්‍යාපෘතිය මඟින් ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් ඉපයීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ දී ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බව දන්වමි. |